චක්‍රලේඛ අංක -86

අපේ අංකය- ස01
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
අංක 70, පාර්ලිමේන්තු පාර
පැලවත්ත - බත්තරමුල්ල
2021/05/31. දින

සියලුම ප්‍රා දේශීය කළමණාකරුවන් වෙත,

කුඩා තේ වතු අංශයේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය හා භාවිතය

1.) හැදින්වීම

කුඩා තේ වතු අංශයේ තේ ඉඩම් වල දීර්ඝ කාලයක සිට පාලනයකින් තොරව අධික ලෙස රසායනික පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් එම ඉඩම් වල පසෙහි සාරවත්භාවයට දැඩි ලෙස හානි සිදු වී ඇත. ඒ හේතුවෙන් සාරවත් පසක තිබිය යුතු පාංශු ජීවීන් හා කාබනික ද්‍රව්‍ය දීර්ඝ කාලයක් තිස්සේ හායනයට ලක්වීමෙන් **නිසරුවී ඇති පස සාරවත්භාවයට පත් කර ගැනීම සඳහා එම ක්ෂේත්‍රයේ නියැලෙන්නන් වශයෙන් කුඩා තේ වතු** සංවර්ධන අධිකාරියේ කාර්යය මණ්ඩලය වන අපට මෙන්ම කුඩා තේ ගොවීන්ට ද සාමූහික වගකීමක් ඇත. ඒ සඳහා කුඩා තේ වතු අංශයේ රසායනික පොහොර භාවිතය වෙනුවට කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම උදෙසා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ඒකක අටක් ප්‍රාදේශිය මට්ටමින් ස්ථාපිත කරනු ලැබේ. **ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ නිර්දේශයන්ට අනුව තේ වගා කප්පාදුවේ දී කප්පාදු අතු වැලලීම වැනි** ක්‍රියාකාරකම් වලින් හා ස්වභාවිකව පසට එක් වන කාබනික ද්‍රව්‍ය ප්‍රශස්ත මට්ටමක පවතී නම් යෙදිය යුතු රසායනික පොහොර හා කාබනික පොහොර අතර අනුපාතය 80 : 20 වශයෙන් දක්වා ඇත. එසේම එක් රසායනික පොහොර කි. ග්‍රෑම්. 1 ක අඩංගු පෝෂක ප්‍රමාණය ලබා ගැනීම සඳහා කොම්පෝස්ට් කි. ග්‍රෑම් 10 යෙදීමට අවශ්‍ය වේ. **මෙම නිර්දේශ වලට අනුරූප කුඩා තේ වතු අංශයේ වාර්ෂික කාබනික පොහොර** අවශ්‍යතාවය දල වශයෙන් මෙ. ට. 315,614කි. මෙම අවශ්‍යතාවයට සරිලන පරිදි කාබනික පොහොර නිෂ්පාදනය ආරම්භ කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් වශයෙන් සෑම ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශයකම එක් කොම්පෝස්ට් නිෂ්පාදන ඒකකයක් බැගින් පිහිටුවා එම ඒකක ආදර්ශ කොම්පෝස්ට් නිෂ්පාදන ඒකක වශයෙන් පවත්වා ගෙන **යාමත් සෑම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී කොට්ටාශයකම පුද්ගලික ව්‍යවසායකින් 5 දෙනෙකු බැගින් තෝරා** ඔවුන් කොම්පෝස්ට් නිෂ්පාදකයින් වශයෙන් හඳුන්වාදීමත් අවසාන වශයෙන් පවත්නා පහසුකම් හා කැමැත්ත මත කුඩා තේ වතු හිමියන් කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා පෙලඹවීමත් අදාල ප්‍රාදේශීය කාර්යාලය මගින් සිදු කල යුතුව ඇත.

2.) අරමුණු

i.) තේ වගාවේ කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම

ii.) තේ වගාව තිරසර සංවර්ධන අරමුණුවලට අනුගතව පවත්වා ගෙන යාම

iii.) **රසායනික පොහොර යෙදීම මගින් පසට සිදු වන හානිය අවම කිරීම**

iv.) රසායනික පොහොර ආනයනය සීමා කිරීම මගින් ආර්ථිකයට සවියක් වීම

v.) හායනයකට ලක්වී ඇති පසෙහි සාරවත්භාවය නැවත ප්‍රකෘති තත්වයට පත් කිරීම

3.) ක්‍රියාත්මක ක්‍රමවේදය (ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ උපදෙස් මත)

3.1. කොම්පොස්ට් පොහොර නිෂ්පාදන ඒකක පිහිටුවීම සඳහා ස්ථාන තෝරා ගැනීම හා වෙන් කර ඇති ප්‍රතිපාදන

කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය කිරීම පියවර ගණනාවක ක්‍රියාවලියක් වන බැවින් ඒ සඳහා අවශ්‍ය ඉඩකඩ අවශ්‍යතාවය මත පහත සඳහන් ස්ථාන වල මෙම නිෂ්පාදන ඒකක පිහිටුවනු ලැබේ.

ප්‍රාදේශීය කාර්යාලය	පිහිටුවීමට යෝජිත ස්ථානය	වෙන් කර ඇති ප්‍රතිපාදන (රු. මිලියන)
ගාල්ල	වළහන්දුව	2.50
මාතර	මාවරල	2.50
රත්නපුර	**සන්නස්ගම**	2.50
මහනුවර	හන්තාන	2.50
නුවරඑළිය	කිස්පනේ	2.50
ඌව	හාලි ඇල	2.50
කළුතර	**මතුගම (වෝගන්)**	2.50
කෑගල්ල	හිඟුල	2.50
	මුළු මුදල රු. මිලියන	20.00

3.2. නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය ගොඩනැගිලි

නිෂ්පාදනය සඳහා අවශ්‍ය ගොඩනැගිලි වශයෙන් 40' X 16' ප්‍රමාණයේ අමානෝ තහඩු සෙවිලි කල වහලක් සහිත මඩුවක් හා ඒ තුල හෝ ඉන් පිටත (පවතින ඉඩකඩ ප්‍රමාණය මත) 10' X 10' ප්‍රමාණයේ ගබඩා කාමරයක් සහිත කාර්යාල කාමරයක් ස්ථාපිත කල යුතුය. (මේ සම්බන්ධ මඩුවේ වියුහය ඇමුණුම අංක 01 මගින් ඉදිරිපත් කර ඇත).

3.3. නිෂ්පාදනයට අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය

උපකරණය	**අවශ්‍ය ප්‍රමාණය**
Chopping Machine (තෙකලා විදුලිය අවශ්‍ය වේ.)	1
කොම්පෝස්ට් මඩුව	1
උදළු	2
ඉවල්	2
පොලිසැක් කවර මැසීමේ යන්ත්‍ර	1
සැල්අඩ (විදුලියෙන් ක්‍රියාකරන සැල්අඩයක් නිර්මානය කර ගැනීමට ද හැක)	1
විල්බැරෝ	1
මල් බාල්දි	2
පිහි	2
කළු පොලිතීන් ගේජ් 300	6 Kg.

3.4. නිෂ්පාදනය සඳහා අවශ්‍ය පුහුණුව

මෙම නිෂ්පාදන ඒකක පිහිටුවීම සඳහා ආරම්භයේ දී සහකාර ප්‍රාදේශීය කළමණාකරු (ව්‍යාප්ති) වෙත මූලික පුහුණුවක් ලබා දෙනු ඇත. මෙම පුහුණුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය කරන ආයතනයක් මගින් සිදු කරනු ලැබේ. ඒ අනුව ඉදිරියට අවශ්‍ය පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම ව්‍යාප්ති වැඩසටහන් යටතේ ප්‍රාදේශීය වශයෙන් සිදු කල යුතුය.

3.5. නිෂ්පාදන ධාරිතාවය හා එහි ව්‍යාප්තිය

2021 වසරේ ස්ථාපිත කරනු ලබන එක් ප්‍රාදේශීය ඒකකයක වාර්ෂික නිෂ්පාදන ධාරිතාවය මෙ. ට. 60 වන අතර ඒ අනුව ඒකක අට මගින් වාර්ෂිකව මෙ.ට. 480 ක් නිෂ්පාදනය කිරීමටත් ඉන් ඔබ්බට සෑම තේ පරීක්ෂක / ව්‍යාප්ති **නිලධාරි කොට්ටාශයකම ව්‍යවසායකයින් 5 දෙනා බැගින් කෝරා ගෙන පුද්ගලික කොම්පෝස්ට් නිෂ්පාදන ඒකක** 5 බැගින් ඒකක 720 ක් තේ වගා කරන දිස්ත්‍රික්ක 14 හි පිහිටුවිය යුතුය. මෙම සෑම ඒකකයක් මගින්ම අවම වශයෙන් වාර්ෂිකව මෙ.ට. 60 බැගින් මෙ. ට. 43200 ක් ද වශයෙන් සමස්ත නිෂ්පාදනය ප්‍රාදේශීය මට්ටමින් මෙ. ට. 48000 ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කල යුතුය. එසේම ප්‍රාදේශය බල ප්‍රදේශයේ කුඩා තේ ගොවීන්ට අවශ්‍ය **කොම්පෝස්ට් පොහොර ප්‍රමාණය (රසායනික හා කොම්පෝස්ට් අතර අනුපාතය 80 : 20 වන පරිදි අක්කරයකට** කොම්පෝස්ට් කිලෝ 800 ක්) තමා විසින් ම නිෂ්පාදනය කර ගැනීම සඳහා අවශ්‍ය පුහුණුව, අමුද්‍රව්‍ය සපයා ගැනීම හා මාර්ගෝපදේශනය ලබා දෙමින් කොම්පෝස්ට් නිෂ්පාදනයට හා ඒවා තම වගාවන්ට යෙදීමට ඔවුන්ව පෙළඹවීම සිදු කල යුතුය.

<u>ව්‍යවසායකයින්</u>

තේ පරීක්ෂක කොට්ටාශ මට්ටමින් හඳුනා ගන්නා ව්‍යවසායකින් හට අවශ්‍ය පුහුණුව, ප්‍රාග්ධනය (බැංකු ණය මගින්) හා වෙළඳපොල සොයා ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය කුඩා තේ සංවර්ධන අධිකාරිය විසින් ඔවුනට **ලබාදිය යුතුය.**

<u>කුඩා තේ වතු හිමියන්</u>

කොම්පෝස්ට් තමා විසින්ම සකස් කර ගැනීමට පෙළඹෙන තේ ගොවීන් සඳහා අවශ්‍ය පුහුණුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ව්‍යාප්ති වැඩසටහන් යටතේ ලබා දිය යුතුය.

3.6. අමුද්‍රව්‍ය අවශ්‍යතාවය හා ඒවා සපයා ගැනීම

1% ක අවම නයිට්‍රජන් ප්‍රතිශතයක් සහිත කොම්පෝස්ට් පොහොර මෙ. ට. එකක් (1) නිපදවීම සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය හා ඒවායෙහි අවශ්‍ය ප්‍රමාණයන් පහත පරිදි වේ.

*අමුද්‍රව්‍ය	ප්‍රමාණය (කි. ග්‍රෑ.)
ඉක්මනින් දිරාපත් වන අමු ශාක පත්‍ර හා ලපටි කොටස්	2000 - 2500
වියළි ශාක ද්‍රව්‍ය	1000
අමු ගොම හෝ වෙනත් සත්ව අපද්‍රව්‍ය	500
එප්පාවල රොක් පොස්ෆේට් (ERP)	50
ඩොලමයිට්	50
මුළු අපද්‍රව්‍ය ප්‍රමාණය	3500 - 4000

*අමුද්‍රව්‍ය ලෙස ප්‍රදේශයෙන් පහසුවෙන් ලබා ගත හැකි පහත සඳහන් ද්‍රව්‍ය භාවිතා කල හැක

ඉක්මනින් දිරාපත් වන අමු ශාක පත්‍ර හා ලපටි කොටස්

ග්ලිරිසීඩියා, ඉපිල් ඉපිල්, වල් සූරියකාන්ත, එරබදු, කැලිඇන්ඛ්‍රා, කුරිඤ්ඤා, අඩනහිරියා, කැප්පෙටියා, කහකෝණ, කෙසෙල් කඳන්, වල්පැලෑටි, ජපන් ජබර, සැල්විනියා (ඉහත සඳහන් කොළ වර්ග ඉතා සාර්ථකව භාවිතා කල හැකි නමුත් ප්‍රදේශයේ සුලභ ඕනෑම අමු කොළ වර්ගයක් භාවිතා කිරීමේ හැකියාව ද ඇත.)

වියළි ශාක ද්‍රව්‍ය

පිදුරු, මානා, වියළි වල් පැලෑටි හා මේරූ ශාක පත්‍ර, ඉවතලන තේ, දහයියා

වෙනත් සත්ව ද්‍රව්‍ය

කුකුල් පොහොර (වාණිජ කුකුල් ගොවිපලවලින් ලබාගත් ද්‍රව්‍ය මාස 1 – 2 පමණ කාලයක් එළිමහන් ස්ථානයක **දිරන්නට ඉඩ හැර භාවිතයට ගන්න) , එළු පොහොර.**

සැ. යු. ඉහත අමුද්‍රව්‍ය අඛන්ඩව නිෂ්පාදන ඒකකයට සැපයීම සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් වාර්ෂිකව සැපයුම්කරුවන් ප්‍රාදේශීය මට්ටමින් ලියාපදිංචි කර ගත යුතුය. සපයන ලද **අමුද්‍රව්‍ය සඳහා මාසිකව ගෙවීම් සිදු කල යුතුය.**

3.7. උසස් තත්වයේ කොම්පෝස්ට් සාදා ගැනීමේ දී සැලකිළිමත් විය යුතු කරුණු

කාබන් : නයිට්‍රජන් (C:N) අනුපාතය කොම්පොස්ට් සෑදීමේ ක්‍රියාවලය සඳහා වැදගත් සාධකයකි. අමුද්‍රව්‍ය වල C:N අනුපාතය 10:15 අතර පවත්වා ගැනීමෙන් හොඳ **කොම්පෝස්ට් පොහොර සාදා ගත හැක. නයිට්‍රජන් (N)** අන්තර්ගතය වැඩි අමුද්‍රව්‍ය ලෙස රනිල ශාක නොමේරූ පත්‍ර සත්ව අපද්‍රව්‍ය ආදිය ද C:N අනුපාතය වැඩි අමුද්‍රව්‍ය ලෙස පිදුරු මානා වියළි පත්‍ර ආදිය ගත හැක.

කොම්පෝස්ට් වල සංයුතිය ඒවා සාදා ඇති මූලික අමුද්‍රව්‍ය අනුව වෙනස් වේ. අමුද්‍රව්‍ය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැක.

i. ඉක්මනින් දිරාපත් වන ද්‍රව්‍ය

සාමාන්‍යයෙන් මෙම ද්‍රව්‍ය වල ඉහළ නයිට්‍රජන්(N) ප්‍රතිශතයක් ඇති අතර C:N අනුපාතය 15 ට වඩා අඩු අගයක් ගනී.

උදාහරණ : ග්ලිරිසීඩියා, වල්සූරියකාන්ත, එරබදු, ඉපිල් ඉපිල් වැනි කොළ පැහැනි ශාක පත්‍ර හා ලපටි කොටස්, ගොම, එළු කුකුල් හා ඌරු පොහොර වැනි සත්ව අපද්‍රව්‍ය සැලවීනියා, ජපන් ජබර වැනි ජලජ ශාක

ii. දිරාපත් වීමට අපහසු ද්‍රව්‍ය

සාමාන්‍යයෙන් මෙම ද්‍රව්‍ය වල ඉහළ කාබන් (C) ප්‍රතිශතයක් ඇති අතර C:N අනුපාතය 20 ට වඩා වැඩි අගයක් ගනී.

උදා. පිදුරු, දහයියා, මානා, ගිණි තෘණ, ඉයුකැලිප්ටස් පත්‍ර, වියළි කොල, ඉවතලන තේ

- දිරාපත්වීමේ ක්‍රියාවලිය සඳහා බලපාන ක්ෂුද්‍රජීවීන්ගේ ක්‍රියාකාරිත්වයට තෙතමනය අත්‍යවශ්‍ය සාධකයක් වේ. **කොම්පෝස්ට් සෑදීමේ දී ක්‍රියාවලියේ දී තිබිය යුතු ප්‍රශස්ත තෙතමනය 50-60% පමණ වේ.** තෙතමන ප්‍රමාණය ප්‍රශස්තව පවතී ද යන්න පරීක්ෂා කිරීම සඳහා අඩි 6 ක් පමණ දිග වියළි කෝටුවක් කොම්පෝස්ට් ගොඩට ඇතුලු කර තෙතමනය පරීක්ෂා කල හැක.

- කොම්පෝස්ට් ක්‍රියාවලිය හොඳින් සිදු වීම සඳහා වාතනය ප්‍රධාන වශයෙන් බලපායි. මේ සඳහා අමුද්‍රව්‍ය කැබලි වල ප්‍රමාණය වැදගත් සාධකයක් වන අතර කැබලි වල විශාලත්වය සෙ.මී. 2 - 5 අතර පවත්වා ගැනීම වඩාත් සුදුසු වේ. කැබලි ප්‍රමාණයට වඩා කුඩා වූ විට වාතනය හොඳින් සිදු නොවන අතර කැබලි විශාල වූ විට ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වයට බාධා සිදු වේ.
- කොම්පෝස්ට් ක්‍රියාවලිය හොඳින් සිදුවීම සඳහා pH අගයද බලපාන අතර උසස් තත්වයෙන් යුත් කොම්පෝස්ට් වල pH අගය 6.5 – 8.0 ත් අතර වේ. නිර්දේශිත ද්‍රව්‍ය නියමිත ප්‍රමාණයන්ගෙන් භාවිතා කිරීම තුලින් pH අගය නිසි පරිදි පවත්වා ගත හැක. කොම්පෝස්ට් සෑදීමේ දී ක්‍රියාවලිය අතුරතුරේ දී අළු හෝ අළු හුණු භාවිතා නොකල යුතුය. මෙම ක්‍රියාවලිය අවසන් වූ පසු නිපදවූ කොම්පෝස්ට් මෙ.ට. එකකට දැව අළු හෝ ඩොලමයිට් කි. ග්‍රෑම් 50 ක් පමණ මිශ්‍ර කිරීම වඩාත් යෝග්‍යය.
- ආකලන ද්‍රව්‍ය (දියකල අමු ගොම හෝ ගව මූත්‍ර වැනි සත්ව අපද්‍රව්‍ය, මොලැසස්, කොහොඹ ඇට, පුන්නාක්කු ආදිය) එකතු කිරීමෙන් කොම්පෝස්ට් සෑදීමේ ක්‍රියාවලිය වේගවත් කල හැකි අතර කොම්පෝස්ට් වල ගුණාත්මකභාවය ද ඉහළ නැංවිය හැක.
- කොම්පෝස්ට් සෑදීමේ දී ERP එකතු කිරීමෙන් ක්ෂුද්‍රජීවීන්ගේ ක්‍රියාකාරිත්වය ඉහළ නංවන අතර කොම්පෝස්ට් වල අඩංගු පොස්පරස් ප්‍රමාණය ද ඉහළ නංවයි.

3.8. නිෂ්පාදනය

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය මගින් ලබා දී ඇති නිෂ්පාදන ක්‍රියාවලිය හා තේ වගාවේ දී භාවිතය පිළිබඳ විස්තර අමුණුම් අංක 1 මගින් දක්වා ඇත.

3.9. නිෂ්පාදනය කරනු ලබන කොම්පොස්ට් පොහොර වල තත්වය

නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් වල තත්වය නියමිත ප්‍රමිතියටම තිබිය යුතුය. නිෂ්පාදනය කරනු ලබන සෑම කොම්පොස්ට් මෙ.ට. 5 ක් අවසානයේම ඒවා ගොවීන් වෙත නිකුත් කිරීමට ප්‍රථම එම තොගයේ සාම්පලයක් ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයට යවා සාම්පල පරීක්ෂා කර ගත යුතුය. යම් හෙයකින් මෙම සාම්පලයක් අසමත් වුවහොත් එම සාම්පලයට අයත් තොගය භාවිතය සඳහා නිකුත් නොකල යුතුය. නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් පොහොර වල ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ නිර්දේශ වලට අනුව තිබිය යුතු ප්‍රමිතිය පහත පරිදි වේ.

පරාමිතිකය	ප්‍රශස්ත පරාසය
pH	(6.5 - 8.5)
කාබන් ප්‍රතිශතය (C%)	(20% >)
නයිට්‍රජන් ප්‍රතිශතය (N%)	(1.0% >)
කාබන් නයිට්‍රජන් අනුපාතය (C/N)	(10-25)
පොස්පරස් ප්‍රතිශතය (P2O5%)	(0.5% >)
පොටෑසියම් ප්‍රතිශතය (K2O%)	(1.0% >)
මැග්නීසියම් ප්‍රතිශතය (MgO%)	(0.5% >)

3.10. විකුණුම් මිල හා අලෙවිය

කොම්පෝස්ට් මෙ.ට. 1 ක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය වන පිරිවැය පහත දක්වා ඇත

අමු ද්‍රව්‍ය	ඒකකය	ඒකක මිල (රු.)	අවශ්‍ය ප්‍රමාණය (කි. ග්‍රෑ.)	අවශ්‍ය මුදල (රු.)
ඉක්මනින් දිරාපත් වන අමු ශාක පත්‍ර හා ලපටි කොටස්	කි. ග්‍රෑ.	1.00	2500.00	2500.00
වියළි ශාක ද්‍රව්‍ය	කි. ග්‍රෑ.	1.00	1000.00	1000.00
අමු ගොම හෝ වෙනත් සත්ව අපද්‍රව්‍ය	කි. ග්‍රෑ.	2.00	500	1000.00
එප්පාවල රොක් පොස්පේට් (ERP)	කි. ග්‍රෑ.	16.00	50	800.00
ඩොලමයිට්	කි. ග්‍රෑ.	4.00	50	200.00
කම්කරු ඒකක	ඒකක	1000.00	7	7000.00
ඇසුරුම්	ඒකක	3.00	50	150.00
			4100	12650.00

විකුණුම් මිල (රු.)

ඉහත අනුව කොම්පොස්ට් කි. ග්‍රෑ. එකක් නිෂ්පාදනය කිරීම සඳහා රු. 12.65 ක නිෂ්පාදන වියදමක් වැය වේ. **එබැවින් කොම්පෝස්ට් කි. ග්‍රෑ. 1 ක විකුණුම් මිල රු. 15 ක් වශයෙන් තීරණය කල හැක. අමුද්‍රව්‍ය මිල ගනන් වල** විචලනය අනුව මෙම විකුණුම් මිල කාලීනව වෙනස් විය හැක.

අලෙවිය

නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් සහනාධාරලාභීන් හට වගාවට යෙදීම සඳහා සහනාධාර මුදලින් අඩු කර **ලබා දීම ද සිදු කල හැක.**

3.11. අධීක්ෂණය

මෙම නිෂ්පාදන ඒකකය ප්‍රාදේශීය කළමණාකරුගේ අධීක්ෂණය යටතේ සහකාර ප්‍රා. කළමණාකරු (ව්‍යාප්ති) විසින් කළමණාකරණය කල යුතුය

4. ක්‍රියාකාරී සැලැස්ම

ක්‍රියාකාරකම	ආරම්භක දිනය	අවසන් කල යුතු දිනය	වගකීම
බිම සකස් කිරීම හා කොම්පෝස්ට් මඩුව සකස් කිරීම	2021/06/10	2021/06/25	ප්‍රා. කළමණාකරු / පරිපාලන නිලධාරී
Chopping machine මිල දී ගැනීම	**2021/06/10**	**2021/06/17**	**ස. සාමාන්‍යාධිකාරී (සේවා)**
තෙකලා විදුලි සම්බන්ධතාවයක් ලබා ගැනීම	2021/06/15	2021/06/22	ප්‍රා. කළමණාකරු / පරිපාලන නිලධාරී
අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	2021/06/15	2021/06/25	ප්‍රා. කළමණාකරු / පරිපාලන නිලධාරී
අනෙකුත් උපකරණ හා ද්‍රව්‍ය මිල දී ගැනීම	**2021/06/10**	**2021/06/24**	**ප්‍රා. කළමණාකරු /** පරිපාලන නිලධාරී
Chopping machine සවි කිරීම හා ඒවායෙහි ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම	2021/06/20	2021/06/24	ප්‍රා. කළමණාකරු / ස. ප්‍රා. කළ (ව්‍යාප්ති)
නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම	2021/07/01		ප්‍රා. කළමණාකරු / ස. **ප්‍රා. කළ (ව්‍යාප්ති)**
කොම්පෝස්ට් නිෂ්පාදනය කේෂ්ත්‍රෙය් ව්‍යාප්ත කිරීම	**2021/08/01**		**ස. ප්‍රා. කළ (ව්‍යාප්ති) /** කළාප සංවර්ධන නිලධාරී / තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරී / සමිති
පසුවිපරම	**2021/06/10**		**ස. කළමණාකරු** (සංවර්ධන)

5. වෙනත්

මෙම ව්‍යාපෘතිය ලාභදායී ලෙස පවත්වා ගෙන යාම සඳහා කොම්පොස්ට් නිෂ්පාදනයට ඔබ ප්‍රදේශයේ සුලභව ඇති අමුද්‍රව්‍ය භාවිතා කල හැකි නමුත් අවසානයේ එහි ප්‍රමිතියට අනුගත ව කටයුතු කිරීම ඔබගේ වගකීමක් වනු ඇත.

මහින්ද විද්‍යානපතිරණ
සභාපති

පිටපත් 1.) සාමාන්‍යාධිකාරී

2.) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සං/ව්‍යා.)

3.) අභ්‍යන්තර විගණක

4.) කළමණාකරු (මුදල්/සංවර්ධන/මානව සම්පත්/සැ.නි.)

5) සියලුම මාණ්ඩලික නිලධාරීන්

6.) සියලුම කළාප සංවර්ධන නිලධාරීන්

7.) සියලුම තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරීන්

8) ගරු සභාපති /ගරු ලේකම් සමස්ත ලංකා සමිති සම්මේලනය

ඇමුණුම් අංක 1

තේ ඉඩම් වල කොම්පොස්ට් භාවිතය පිළිබඳ ව මාර්ගෝපදේශය

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය

කොම්පෝස්ට් යනු ශාක ද්‍රව්‍ය හා සත්ව අපද්‍රව්‍ය උපයෝගි කර කාබනික පොහොර සෑදීමේ ක්‍රමයකි. එමගින් කාබනික සංඝටක පරිසරයට අහිතකර ලෙස බලපෑමක් නැතිව බෝග සඳහා යොදා ගත හැකි **තත්වයකට පාලිත තත්ව යටතේ ජීව විද්‍යාත්මකව දිරාපත් වීමට සලසයි.**

සෙවන ගස් අතු භාවිතයට නොගත් ප්‍රදේශවල වැඩෙන තෘණ සහ පිදුරු, තේ කප්පාදු කොටස්, ඉවතලන තේ, කොහුබත්, මොලැසස් ආදී දව්‍යය ගොම සමග මිශ්‍ර කර කොම්පොස්ට් සාදා ගත හැක.

කොම්පොස්ට් සකස් කිරීම

1.) කොම්පෝසට් සකස් කරන ස්ථානයේ දිග මීටර් 7.2 (අඩි 25) හා පළල මීටර් 1.2 (අඩි 4) කි.
2.) කොම්පෝස්ට් සකස් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා හොඳින් දිරාපත් වූ කොළ සහ අතු හෝ පැරණි කොම්පෝස්ට් සෙන්ටිමීටර් 7.5 (අගල් 3) පමණ උසකට අතුරන්න.
3.) තණ කොළ, කොටස් වලට කපන ලද කොළ පොහොර ශාක ආදිය සෙ.මී. 45 (අගල් 18) ක් උසට ඒ මත අතුරන්න.
4.) ගොම හෝ වෙනත් සත්ව පොහොර තට්ටුවක් සෙ.මී. 7.5 (අගල් 3) ක් උසට නැවත ඒ මත අතුරන්න.
5.) එප්පාවල රොක් පොස්පේට් (ERP) කි. ග්‍රෑම්. 50 ක් පමණ තුනී ස්ථර ලෙස අතුරන්න
6.) කොම්පෝස්ට් ගොඩ දැන් මීටර් 0.6 (අඩි 4) ක් පමණ උස වනු ඇත. කොම්පෝස්ට් ගොඩක අවසාන උස මීටර් 1.2 (අඩි 4) ක් පමණ උසක් දක්වා ඉහත ආකාරයට නැවත ස්ථර එකතු කරන්න

කොම්පෝස්ට් ගොඩක අවසාන මිනුම්

- දිග මීටර් 7.5 (අඩි 25) හෝ පහසු දිගක්
- පළල මීටර් 1.2 (අඩි 4)
- උස මීටර් 1.2 (අඩි 4)

7.) ද්‍රව්‍යය ලබා ගැනීමේ හැකියාව අනුව සමානුපාතිකව කුඩා ගොඩවල් වුවද සකස් කල හැක.
8.) වියළි දිනවලදී කොම්පෝස්ට් ගොඩවල්වලට ප්‍රමාණවත් ලෙස ජලය දමන්න
9.) මසකට වරක්/දෙවරක් ගොඩවල් පෙරලන්න
10.) කොම්පෝස්ට් ගොඩවල් වැසි හා මතුපිට ගලායන ජලයෙන් ආරක්ෂා කල යුතුය. මෙය කල හැක්කේ මඩෙන් කපරාරු කිරීමෙන් හෝ ගොඩවල් කළු පොලිතින් වලින් ආවරණය කිරීමෙන් හා ගොඩවල් වටා නොගැඹුරු කාණු කැපීමෙනි.
11.) කොම්පෝස්ට් ගොඩවල් මාස 2 -3 කින් භාවිතයට සූදානම් වේ.

කොම්පෝස්ට් භාවිතය

<u>අ.) නව වගාවන් වල දී</u>

1. තේ සිටුවන වලක් සෙ.මී. 45 (අගල් 18) ගැබුරකින් හා මතුපිට විශ්කම්භය සෙ. මී. 30 (අඩි 1) වන ලෙස කපා ගත යුතුය.T200 පොහොර ග්‍රෑම් 15-25 අතර ප්‍රමාණයක් කොම්පෝස්ට් කි. ග්‍රෑ. 2 ක් පස් සමග හොඳින් මිශ්‍ර කර තේ වලේ පතුලේ සිට ¾ ක් පමණ දක්වා පුරවා ගන්න.
2. **කම්බිලි පනුවාගේ හා කසල වේයාගේ හානිය වලක්වා ගැනීම සඳහා ජලය මිලි ලීටර් 200 ක දියකර** ගත් කොරජන් (chlorantrainiliprole 200 g/L SC) මිලි ලීටර් 0.2 ක් ඉහත පස් / කොම්පෝස්ට් / පොහොර මිශ්‍රණයට හොඳින් මිශ්‍ර කර වල පිරිවීමට යොදාගන්න

<u>ආ.) පාළු සිටුවීමේ දී</u>

කොරජන් මිලි ලීටර් 0.4 ක් ජලය මිලිලීටර් 400 බැගින් දිය කර ඉහත ආකාරයට පාළු සිටුවීම සඳහා සකස් කල වලක පස්/කොම්පෝස්ට් / පොහොර මිශ්‍රණයට මිශ්‍ර කරන්න.

කොම්පෝස්ට් පොහොර සකස් කිරීමේ පිරිවැය

අමුද්‍රව්‍ය තොගයේ මුළු බර = මීටර් 7.5 ක් දිග මීටර් 1.2 ක් පළල මීටර් 1.2 ක් උස (අඩි 25 4 4)
= ඝන මීටර් 10.8 (ඝන අඩි 400 යි)
අමුද්‍රව්‍ය ඝන මීටරයක තෙත් බර කි. ග්‍රෑ. 420
= 420 ඝන මීටර් 10.8 = කි. ග්‍රෑම් 4500 හෝ මෙ.ට. 4.5

<u>ප්‍රවාහනය ඇතුලු අනෙකුත් වියදම් (මෙම වියදම් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් කේෂ්ත්‍රය් පරීක්ෂා කිරීමෙන් පසු සකස් කල වුවකි)</u>

ගොම කි. ග්‍රෑම් 500 ක් සඳහා (රු. 2 X 500)	=	රු. 1000.00
අමුකොළ කි. ග්‍රෑම් 2500 ක් සඳහා (රු. 1 X 2500)	=	රු. 2500.00
වියළි ද්‍රව්‍ය කි. ග්‍රෑම් 1000 ක් සඳහා (රු. 1 X 1000)	=	**රු. 1000.00**
ඵප්පාවල රොක් පොස්පේට් කි. ග්‍රෑ. 50 ක් සඳහා (රු. 16 X 50)	=	රු. 800.00
ශ්‍රම පිරිවැය (1000 X 7)	=	රු. 7000.00
ඩොලමයිට් කි. ග්‍රෑම් 50 (රු. 4 X 50)	=	රු. 200.00
ඇසුරුම් 50 ක් සඳහා (3 X 50)	=	**රු. 150.00**

මෙ.ට. එකක් සඳහා මුළු පිරිවැය		රු. 12650.00
		==========